**කළුතර ප්‍රාදේශීය සභාව**
**කළුතර දිස්ත්‍රික්කය**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 26 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 16 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජුනි 30 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 **මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 කළුතර ප්‍රාදේශීය සභාවේ දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වැය ලේඛණයට අනුව සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.394,305 ක් වූ පුස්තකාල පොත්වලින් වර්ෂ අවසානයට රු.168,845 ක් පමණක් ප්‍රාග්ධනිත කර තිබීම නිසා පුස්තකාල පොත් ගිණුමේ ශේෂය හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමේ ශේෂය රු.225,460 කින් අඩුවෙන් දැක්විණි.

(ආ) පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් ඉකුත් වර්ෂයේ සභාවට ලබා දී තිබූ කැබ් රථයේ වටිනාකම සමාලෝචිත වර්ෂයේදීද ගිණුම් ගත කර නොතිබීම නිසා වර්ෂය අවසානයට මෝටර් රථ හා කරත්ත ගිණුමේ ශේෂය සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය රු.1,765,682 ක් හා පළාත් පාලන ණය ගිණුම හා උපයෝගීතා සේවා ගිණුමේ ශේෂ රු.1,412,774 ක් ගිණුම්වල දක්වා නොතිබුණි.

(ඇ) පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් වැටුප් ප්‍රතිපූර්ණවලින් අඩු කර ගෙන තිබූ කැබ් රථයේ ණය වාරික රු.1,059,409 ක් ප්‍රාග්ධන වැය ගිණුම හර කිරීම වෙනුවට හිඟ හිටි වෙනත් ආදායම් ගිණුමට ගිණුම් ගත කර තිබුණි.

(ඈ) සභා තීරණයක් මගින් ඉකුත් වර්ෂයන්ට අදාලව කපා හැර තිබූ රු.136,416 ක් වූ ආදායම්, ආදායම් හා වියදම් ගිණුමට ගැලපීම නිසා සමාලෝචිත වර්ෂයේ ආදායම එම වටිනාකමින් අඩුවෙන් දැක්විණි.

(ඉ) 2014 මැයි හා සැප්තැම්බර් මාසවල නිකුත් කර තිබූ රු.310,342 ක් වූ චෙක්පත් දෙක අවලංගු කර ඒ සඳහා නැවතත් වෙනත් චෙක්පත් 2 ක් නිකුත් කර තිබුණද, අළුතින් නිකුත් කළ චෙක්පත් 2 නව ගෙවීමක් ලෙස සළකා ගිණුම් ගත කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු වැටුප් රු.53,316 ක් අදාල වැය විෂයයන්ට හර කිරීම වෙනුවට සමුච්චිත අරමුදලට හර කර තිබුණි.

(උ) කර්මාන්ත ව්‍යාපෘතිවලට අදාලව ගෙවිය යුතු රු.13,062,597 ක් සඳහා ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබූ එකතුව රු.501,465 ක් වූ වත්කම් අයිතම 03 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(එ) ඉකුත් වර්ෂයේ මාගේ වාර්තාවේ සඳහන් කර තිබූ 2.2.2 (ආ), (ඉ), (ඊ) යන ගිණුම්කරණ අඩුපාඩු සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදයම රු.22,971,768 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදයම රු.9,786,395 ක් විය.

### 2.2 බැංකු ගිණුම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2009 සැප්තැම්බර් මාසයට අදාලව පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු දේපල ණය පොලී රු.15,211 ක් විගණිත දිනය වූ 2015 මැයි 19 දින වන විටත් බැංකු සැසඳුම් ප්‍රකාශයේ උපලබ්ධි නොවූ චෙක්පත් ලෙස ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ආ) 2014 අප්‍රේල් සහ නොවැම්බර් මාසවල තැන්පත් කර තිබූ රු.179,469 ක වටිනාකම වූ චෙක්පත් විගණිත දිනය වූ 2015 මැයි 19 වන විටත් උපලබ්ධි වී නොතිබුණි.

(ඇ) 2014 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශයේ වැඩියෙන් තැන්පත් කිරීම් හා අඩුවෙන් තැන්පත් කිරීම් ලෙස පිළිවෙලින් දක්වා තිබූ රු.9,224 ක් හා රු.64 ක් හඳුනාගෙන මුදල් පොතේ ගැලපීම් කිරීමට 2015 මැයි 19 වන විටත් කටයුතු කර නොතිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000’ | රු.000’ | රු.000’ |
| (i) වරිපනම් හා බදු | 17,268 | 6,027 | 5,677 |
| (ii) බදු කුලී | 2,099 | 2,099 | -- |
| (iii) බලපත්‍ර ගාස්තු | -- | -- | -- |
| (v) වෙනත් ආදායම් | -- | -- | -- |

#### 2.3.2 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂය ආරම්භයට වරිපනම් බදු හිඟ ශේෂය රු.3,274,839 ක් වූ අතර වර්ෂයේ වරිපනම් බදු බිල් කිරීම රු.8,172,730 ක් විය. 2014 ජනවාරි 01 දිනට ආරම්භක හිඟයෙන් රු.870,037 ක් හෙවත් සියයට 26.5 ක් අයකරගෙන තිබූ අතර ප්‍රවර්ථන වර්ෂයේ බිල් කළ ආදයමින් රු.5,107,752 ක් හෙවත් සියයට 62 ක් අයකරගෙන තිබුණි. ඒ අනුව 2014 දෙසැම්බර් 31 දිනට සමස්ථ වරිපනම් බදු හිඟ ශේෂය රු.5,668,984 ක් විය.

#### 2.3.3 කඩකාමර බදුදීම

සභා අරමුදලින් රු.4,500,000 ක් වැය කර ඉදි කර තිබූ කඩකාමර 9 කින් සමන්විත මොරොන්තුඩුවේ වෙළඳ සංකීරණය 2005 දෙසැම්බර් 09 දින විවෘත කර තිබුණි. මෙම කඩකාමර අතරින් කඩකාමර 4 ක් විවෘත කළ දින සිටද, එක් කඩකාමරයක් 2011 අගෝස්තු සිටද, තවත් කඩකාමරයක් 2013 සිටද බදු දී නොතිබුණි.

2.3.4 **ත්‍රී රෝද රථ ගාස්තු**

සභාවේ ලියාපදිංචි ත්‍රී රෝද රථ 688 න් 520 ක් 2014 වර්ෂයට අදාල නැවතුම්පල බලපත්‍ර ගාස්තුව වූ රු.312,000 ක් විගණිත දිනය වූ 2014 දෙසැම්බර් 15 වන විටත් ගෙවා නොතිබුණි.

2.3.5 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 59,560,414 |
| (ii) | මුද්දර ගාස්තු | 40,000,000 |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **අවිධිමත් ගනුදෙනු**

(අ) **විදේශ ගමන්**

(i) සභාපති, මන්ත්‍රීවරු 15 දෙනෙකු හා කළමනාකරණ සහකාරවරියක් දින 06 ක් තායිලන්තයේ වැඩමුළුවක් සඳහා සහභාගි වීම වෙනුවෙන් රු.4,037,855 ක් සභා අරමුදලින් වියදම් දරා තිබුණි. 2014 වර්ෂයේ අයවැය මගින් විදේශ ගමන් වියදම් වෙනුවෙන් කිසිදු මුදලක් ප්‍රතිපාදනය කර නොතිබුණි. ඒ අනුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ VI කොටසේ 170 හා 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති ප්‍රකාරව මෙම වියදම වැය කිරීමට ප්‍රථම පරිපූරක ඇස්තමේන්තුවක් සභාවේ සම්මත කර ගත යුතු වුවත් එසේ නොකර වැය ශීර්ෂ මාරු කිරීමෙන් වියදම දරා තිබුණි.

(ii) මෙම විදේශ සංචාරය සඳහා සංයුක්ත දීමනා වශයෙන් සභාපති විසින් රු.175,866 ක් ද, මන්ත්‍රීවරු 15 දෙනා සහ කළමනාකරණ සහකාරවරිය විසින් රු.136,131 ක් බැගින් ලබාගෙන තිබූ අතර මේ සඳහා එක් එක් නිලධාරියා විසින් ගමන් වියදම් වවුචර්පත් ඉදිරිපත් නොකර එකතුව රු.2,353,962 ක් සඳහා එක් වවුචරයක් මගින් සභාපති නමට ගෙවීම් කර තිබුණි.

(ආ) **පොසොන් උත්සව වියදම්**

2014 වර්ෂයේ සභාව සහ සභාවේ සුබසාධක සංගමය එක්ව පොසොන් කලාපයක් පවත්වා තිබුණි. මේ සඳහා ඇස්තමේන්තුගත වියදම රු.1,770,000 ක් වී තිබූ අතර ඉන් රු.970,000 ක් සභා අරමුදලින් වැය කිරීමටත්, රු.800,000 ක් ප්‍රදේශයේ ව්‍යාපාරික ස්ථාන හා මහජන පරිත්‍යාග මුදල්වලින් වැය කිරීමටත් 2014 අප්‍රේල් 24 දින සභා අනුමැතිය ලබාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව පොසොන් කලාපය සඳහා මහජන ආධාර අනුග්‍රහ දායකත්ව, තොරණ ආදායම් හා සැණකෙලි ආදායම් ලෙස ලැබී තිබූ රු.651,390 ක් සඳහා ලදුපත් නිකුත් කර නොතිබූ අතර එම මුදල් සභා අරමුදලට බැර කර නොතිබුණි.

(ii) පොසොන් කලාපයේදී පවත්වා තිබූ සැණකෙලියේ ටිකට්පත් වෙනුවෙන් විනෝද බදු අය කර නොතිබූ අතර 2014 ජූනි 05 දිනැති ලිපිය මගින් සභාපති හා සැණකෙලිය පවත්වා තිබූ අයගේ එකඟතාවය මත දිනකට රු.20,000 බැගින් රු.60,000 ක් අයකර තිබුණද, එම මුදල්ද සභා අරමුදලට බැර කර නොතිබුණි.

(iii) පොසොන් කලාපයේ වියදම්වලින් එකතුව රු.648,390 ක් වූ වියදම් සඳහා ගෙවීම් වවුචර්පත් ලියා නොතිබුණි.

3.2 **<u>මෙහෙයුම්/කළමනාකරණ අකාර්යක්ෂමතා</u>**

(අ) 2013 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් දක්වා ගෙවා තිබූ එකතුව රු.618,749 ක් වූ අත්තිකාරම් 2015 මැයි 15 වන විටත් පියවා නොතිබුණි.

(ආ) සභාවේ සේවයේ නියුතුව සිට ස්ථාන මාරු වී ගොස් තිබූ හා සේවය හැර ගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් 11 දෙනෙකුගෙන් අය විය යුතුව තිබූ සේවක ණය රු.488,880 ක් විගණිත දිනය වූ 2014 දෙසැම්බර් 12 දින වන විටත් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

3.3 **<u>කාර්යසාධනය</u>**

(අ) **<u>මග නැගුම ව්‍යාපෘති</u>**

(i) මග නැගුම ග්‍රාමීය සංවර්ධන වැඩසටහන-2014 යටතේ සභා බල ප්‍රදේශයේ මාර්ගවල අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි ගල් ඇතිරීම සඳහා රු.500,000 බැගින් වූ ව්‍යාපෘති 36 ක් සඳහා රු.18,000,000 ක් අනුමත වී තිබූ අතර 2015 දෙසැම්බර් 15 වන විට ව්‍යාපෘති 05 ක පමණක් වැඩ නිම කර තිබුණි.

(ii) රු.4,000,000 ක් වූ ව්‍යාපෘති 07 ක් සඳහා ගිවිසුම් අත්සන් කර වැඩ ආරම්භ කර තිබූ අතර රු.5,500,000 ක් වූ ව්‍යාපෘති 11 ක ඇස්තමේන්තු පමණක් පිළියෙල කර තිබුණි.

(iii) ව්‍යාපෘති 13 ක කිසිදු කාර්යයක් සිදු කර නොතිබුණි.

(ආ) **<u>බටහිර රන් අරුණ ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන -2014</u>**

බටහිර රන් අරුණ ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන -2014 යටතේ ප්‍රාදේශීය ලේකම් විසින් අනුමත කර තිබූ රු.6,875,000 ක් වූ ව්‍යාපෘති 17 න් සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘති 13 ක් පමණක් අවසන් කර තිබුණි.

4. **<u>පද්ධති හා පාලන</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය